ලේකම් පත්‍ර පරීක්ෂකවරුන්ගේ
ප්‍රයෝජනය සඳහා පමණි.

31059

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

පැය තුනයි

අතිරේක කියවීම් කාලය - මිනිත්තු 10යි.

- I කොටසේ ප්‍රශ්නය ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සැ. යු. :- I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

J.A.J.R Jayakody
Deputy Commissioner of Examinations
Confidential (I/E)
Department of Examinations, Sri Lanka.
Pelawatta, Battaramulla.

විභාග අංකය .....

I කොටස

1. (i) (අ) ධර්ම සංගායනාවන්හි මූලික පරමාර්ථය වූයේ කුමක් ද?

.....

.....

(ආ) ප්‍රථම ධර්ම සංගීතියේදී සාකච්ඡාවට බඳුන් වූ ප්‍රධානම ගැටලුවක් වූයේ කුමක් ද?

.....

.....

(ලකුණු 02 යි)

(ii) (අ) දෙවන ධර්ම සංගායනාව සඳහා ඉවහල් වූ ප්‍රධානම සාධකය (ගැටළුව) කුමක්ද?

.....

(ආ) එම සාධකය (ගැටළුව) පැනනැගුනේ කවර භික්ෂූන්ගේ ක්‍රියාකලාපය නිසා ද?

.....

(ලකුණු 02 යි)

(iii) (අ) ථේරවාදී භික්ෂූන්ට එරෙහිව දෙවන ධර්ම සංගායනාවේදී කරුණු පහක් ඉදිරිපත් කළ භික්ෂූන් වහන්සේගේ නම කුමක් ද?

.....

(ආ) 'මහාසංඝික' නම් අභිනව නිකාය බිහිවූයේ කවර සංගායනාවට පසුව ද?

.....

(ලකුණු 03 යි)

(iv) (අ) 'ලෝකානුවර්තනය' යන්නෙහි අර්ථය කුමක් ද?

.....

(ආ) රහත් බව හීනාධිමුක්තියක් ලෙස තහවුරු කිරීම සඳහා ඉදිරිපත් වූ සාධක දෙකක් දක්වන්න.

(1) .....

(2) .....

(ලකුණු 03 යි)

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki

(v) (අ) රහතන් වහන්සේලා, ගරුකරන පිරිස පරාජයට පත්වූයේ කවර සංගීතියේදී ද?

.....

(ආ) සම්මිතීය නිකායයේ ඉතිහාසය ලියන ලද්දේ කවර ආචාර්යවරයෙකු විසින් ද?

.....

(ලකුණු 03 යි)

(vi) (අ) නිකාය භේදයේ දෙවන පියවර දක්නට ලැබෙන්නේ කවර රාජ වංශයේදී ද?

.....

(ආ) වාත්සීය පුත්‍ර නමැති භික්ෂුව ඉදිරිපත් කළ නව සංකල්පය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(vii) (අ) ගෝකුලික ගුරුකුලය අයත් වන්නේ කවර නිකායකට ද?

.....

(ආ) ගෝකුලික ගුරුකුලයේ ප්‍රධාන මතය ගොඩනැගී ඇත්තේ කවර ඉගැන්වීමක් පදනම් කොටගෙන ද?

.....

(ලකුණු 03 යි)

(viii) (අ) ගෝකුලිකයන් සැබෑ බුද්ධ ධර්මය ලෙස පිළිගන්නේ කුමක් ද?

.....

(ආ) සූත්‍ර දේශනා පිළිබඳ ඔවුන්ගේ ආකල්පය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(ix) (අ) සංඝයා නිකාය පහකට බෙදී ගියේ කවර රාජ්‍ය සමයකදී ද?

.....

(ආ) ස්ථිරවාදී නිකායට වඩාත් අභිරුචිකත්වයක් දැක්වූ රජු කවරෙක් ද?

.....

(ලකුණු 03 යි)

(x) (අ) ඒකව්‍යවහාරික සම්ප්‍රදායයෙන් බිහි වූ නව නිකාය කුමක් ද?

.....

(ආ) 'බුදු සිරුර ලෝකෝත්තරය' යනුවෙන් දැක්වෙන ප්‍රධාන ග්‍රන්ථය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

S 4

● ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

1. (i) සංඝ සමාජය ධර්මාශෝක අවධිය වන විට පැවති තත්ත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා ධර්මාශෝක රජුගෙන් ඉටු වූ කාර්යභාරය ගෙනහැර දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) ධර්මාශෝක රජතුමාගේ ආගමික සහනශීලතා ප්‍රතිපත්තිය හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

2. (i) මහායාන බුදුසමයේ ප්‍රභවය සඳහා ඉවහල් වූ සාධක කෙටියෙන් ගෙනහැර දක්වන්න. *(ලකුණු 06 යි)*

(ii) 'බුද්ධ සංකල්පය' මහායාන ඉගැන්වීම් තුළ අර්ථවත් වන අයුරු කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) 'බෝධිචිත්තය' පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) නාලන්දා විශ්වවිද්‍යාලයේ පැවති විෂයධාරා පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) නාලන්දා විශ්වවිද්‍යාලයේ පැවති අධ්‍යාපන ක්‍රමය ගෙනහැර දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) නාලන්දා විශ්වවිද්‍යාලයේ සිටි වියතුන් හා ඔවුන්ගේ ග්‍රන්ථකරණය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

4. (i) දීඝ නිකාය හා මජ්ඣිම නිකායට අයත් අටුවා ග්‍රන්ථ පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) "බුද්ධඝෝෂ හිමියන් බෞද්ධ අර්ථකථාචාරීන් අතුරෙන් ශ්‍රේෂ්ඨතමයායි" මේ පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) පාලි අටුවා ග්‍රන්ථ සම්පාදනයේදී බුද්ධඝෝෂ හිමියන් අනුගමනය කළ න්‍යායය පිළිබඳ විමසීමක යෙදෙන්න. *(ලකුණු 06 යි)*

5. (i) බුරුමයට බුදුසමය ව්‍යාප්ත වූ ආකාරය පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) බුරුම ජනයාගේ ජන ජීවිතය බුදුසමය තුළින් පෝෂණය වූ ආකාරය ගෙනහැර දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) මධ්‍යාසියාවේ බුදුසමය ව්‍යාප්තව තිබූ බවට දැක්විය හැකි සාධක පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) ප්‍රාග් මහින්ද යුගයේ පැවති ඇදහිලි හා විශ්වාස පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) බෞද්ධ ඉගැන්වීම් තුළින් ලාංකීය රජවරුන් ලද ආභාෂය ගෙනහැර දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) අභයගිරි විහාරයේ ආරම්භයත් සමග ලාංකීය ශාසන ඉතිහාසයේ සිදු වූ නව ප්‍රවණතා පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

7. (i) ගන්ධාර බුදුපිළිම සම්ප්‍රදායයෙහි මූලික ලක්ෂණ හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(ii) සමාධි මුද්‍රාවෙහි මූලික ලක්ෂණ ගෙනහැර දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) ස්තූප වර්ග පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

මෙතනින් වෙන් කරන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library